
# සතිපතා ආර්ථික දර්ශක

2022 සැප්තැම්බර් 30



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි ඉහළ යෑම් හේතුවෙන්, 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 64.3හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2022 සැප්තැම්බර් මාසයේ දී, ආහාර කාණ්ඩයේ සහ ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පිළිවෙලින්, සියයට 94.9ක් සහ සියයට 57.6ක් ලෙස වාර්තා විය. තවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි. දර්ශකයෙහි වෙනස 2022 අගෝස්තු මාසයේ පැවති සියයට 28.0හි සිට 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 33.4ක් දක්වා ඉහළ ගියේය.

2022 වසරේ පළමු මාස අට තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ නිෂ්පාදනය පහත වැටුණු අතර, අවශ්‍ය පරිදි පොහොර නොලැබීම ඒ සඳහා හේතු විය. එමෙන්ම, රබර් වගාකරන ප්‍රදේශවල පැවැති අහිතකර කාලගුණික තත්ත්ව, දිලීර රෝගයක් ව්‍යාප්තවීම සහ පොහොර හිඟවීම යන සාධකවල ඒකාබද්ධ බලපෑම හේතුවෙන් රබර් නිෂ්පාදනය ද පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසර මුළුල්ලේ සහ 2022 වසරේ මේ දක්වා පැවති හිතකර කාලගුණ තත්ත්වයන්හි පසු බලපෑම හේතුවෙන් පොල් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

සේවා වියුක්ති අනුපාතිකය 2022 පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.3හි සිට 2022 දෙවන කාර්තුවේ දී සියයට 4.6ක් දක්වා ඉහළ යන ලදී.
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2022 පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 51.2හි සිට 2022 දෙවන කාර්තුවේ දී සියයට 50.1ක් දක්වා පහළ යන ලදී.

සලකා බලන කාලපරිච්ඡේදය (2022.09.24 සිට 2022.09.30 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කාලපරිච්ඡේදය ආරම්භයේ දී එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් මිල ගණන් පහත වැටුණි. ඉන් පසුව, ඉයන් සුළි කුණාටුව හමුවේ එක්සත් ජනපදයේ මෙක්සිකෝ වෙරළබඩ තීරයේ සැපයුම් සීමා කිරීම, එක්සත් ජනපද ඩොලරය අවප්‍රමාණය වීම සහ එක්සත් ජනපද තෙල් සංචිත අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩියෙන් පහත වැටීම හේතුවෙන් මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ඉදිරි සතිය තුළ ඔපෙක් සංවිධානය සහ ඊට සහාය දක්වන අනෙකුත් රටවල් විසින් සිදුකිරීමට අපේක්ෂිත සැපයුම් සීමා කිරීමේ බලපෑම අභිබවා, අයහපත් ඉදිරි ආර්ථික දැක්ම පිළිබඳ වෙළෙඳුන් තුළ වූ අපේක්ෂා හේතුවෙන් සතියේ අග භාගය වන විට මිල ගණන් සුළු වශයෙන් පහත වැටුණි. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල ගණන්, පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් 2.43කින් සහ එක්සත් ජනපද ඩොලර් 2.71කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2022 සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 94 කින් සියයට 25.95ක් දක්වා පහළ ගියේය.

2022 අගෝස්තු මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 14.0ක් විය.
2022 අගෝස්තු මාසයේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 163.7කින් ඉහළ ගියේය.
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 අගෝස්තු මාසයේ දී රුපියල් බිලියන 54.2කින් පහළ ගියේය.
පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 අගෝස්තු මාසයේ දී රුපියල් බිලියන 59.0කින් පහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය සහ සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය පහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් පහළ යන ලදී.

සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 569.85ක හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 568.46ක හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2022 සැප්තැම්බර් 30 වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.34කින් දර්ශක අගය 9,931.07ක් දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා දර්ශකය සියයට 1.18කින් දර්ශක අගය 3,165.33ක් දක්වා පහළ ගියේය.

## විදේශීය අංශය

2022 වසරේ සැප්තැම්බර් 30 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 44.8කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 39.5කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 36.2කින්, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 32.7කින් සහ ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 30.6කින් අවප්‍රමාණය විය.


2022 වසරේ අගෝස්තු මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,717ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | අගෝස්තු 2022 | මසකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 250.4 | 244.4 | 147.1 |
| මාසික ප්‍රතිශත වෙනස % | 2.5 | 5.6 | 0.3 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 31.3 | 25.9 | 5.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 70.2 | 66.7 | 6.7 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 235.1 | 229.0 | 146.5 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 26.0 | 21.3 | 4.4 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 60.5 | 57.3 | 4.7 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100)** | **සැප්තැම්බර් 2022** | **මසකට පෙර** | **වසරකට පෙර** |
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 244.7 | 235.8 | 144.1 |
| මාසික ප්‍රතිශත වෙනස % | 3.8 | 2.5 | 0.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 33.4 | 28.0 | 4.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 69.8 | 64.3 | 5.7 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 219.3 | 212.0 | 146.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 24.1 | 20.3 | 3.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 50.2 | 46.6 | 5.0 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව




## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ


| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 222.67 | 221.33 | 223.00 | 124.00 | 235.00 | 230.00 | ලැනො. | ලැනො. |
| රතු කැකුළු | 211.00 | 208.25 | 208.60 | 95.30 | 220.00 | 220.00 | 220.00 | ලැනො. |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 292.00 | 352.00 | 240.00 | 160.00 | 336.00 | 402.00 | 290.00 | 200.00 |
| ගෝවා | 316.00 | 338.00 | 326.00 | 95.00 | 376.00 | 386.00 | 384.00 | 128.00 |
| කැරට් | 300.00 | 288.00 | 300.00 | 79.00 | 350.00 | 332.00 | 350.00 | 100.00 |
| තක්කාලි | 200.00 | 168.00 | 138.00 | 59.00 | 250.00 | 200.00 | 184.00 | 79.00 |
| වට්ටක්කා | 162.00 | 150.00 | 124.00 | 55.00 | 188.00 | 170.00 | 144.00 | 80.00 |
| පතෝල | 250.00 | 262.00 | 228.00 | 100.00 | 300.00 | 312.00 | 284.00 | 130.00 |
| වම්බටු | 336.00 | 296.00 | 372.00 | 159.00 | 386.00 | 346.00 | 422.00 | 198.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 443.19 | 456.88 | 386.57 | 215.23 | 492.00 | 521.00 | 398.60 | 260.00 |
| ලොකු ළූණු (ආනයනික) | 156.30 | 133.44 | 144.73 | 120.53 | 172.00 | 154.33 | 164.00 | 130.00 |
| අර්තාපල් (දේශීය) | 318.52 | 337.45 | 356.71 | 137.45 | 376.00 | 384.00 | 384.00 | 160.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,501.50 | 1,538.40 | 1,479.25 | 508.00 | 1,600.00 | 1,733.00 | 1,635.00 | 530.00 |
| පරිප්පු | 410.33 | 416.45 | 428.40 | 232.67 | 430.00 | 432.00 | 450.00 | ලැනො. |
| බිත්තර-සුදු (එකක මිල) | 46.70 | 47.00 | 46.50 | 14.20 | 47.80 | 49.00 | 47.20 | 14.70 |
| පොල් (ගෙඩියක මිල) | 83.40 | 85.00 | 80.00 | 75.00 | 90.00 | 89.00 | 90.00 | ලැනො. |
| අමු මිරිස් | 258.00 | 250.00 | 394.00 | 110.00 | 312.00 | 300.00 | 446.00 | 145.00 |
| දෙහි | 392.00 | 234.00 | 150.00 | 286.00 | 456.00 | 304.00 | 200.00 | 338.00 |


### 1.2.2 පැලියගොඩ සහ මීගමුව මාළු වෙළඳපොළ


| ආහාර අයිතමය | පැලියගොඩ | | මීගමුව | | | |
|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| කෙලවල්ලා | 1,225.00 | 1,160.00 | 1,200.00 | 1,182.00 | 1,680.00 | 1,700.00 |
| බලයා | 596.00 | 570.00 | 550.00 | 635.00 | 700.00 | 1,062.50 |
| සාලයා | 420.00 | 392.00 | 450.00 | 460.00 | 572.00 | 590.00 |
| හුරුල්ලා | 574.00 | 750.00 | 564.00 | 766.00 | 708.00 | 906.00 |


ලැනො. - ලැබී නොමැත.


## නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල





### 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | |
| **සහල්** | | |
| සම්බා | 230.00 | 230.00 |
| රතු කැකුළු | ලැනො. | 215.00 |
| **එළවළු** | | |
| බෝංචි | 220.00 | 272.50 |
| ගෝවා | 299.00 | 291.25 |
| කැරට් | 295.00 | 316.25 |
| තක්කාලි | 164.50 | 103.75 |
| වට්ටක්කා | 145.00 | 139.38 |
| පතෝල | 201.00 | 192.50 |
| වම්බටු | 268.00 | 205.00 |
| අළු කෙසෙල් | 137.00 | 123.75 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 354.00 | 305.63 |
| ලොකු ළූණු (ආනයනික) | 148.00 | 128.75 |
| අර්තාපල් (දේශීය) | 245.00 | 281.25 |
| වියළි මිරිස් (ආනයනික) | 1,500.00 | 1,450.00 |
| පොල් (ගෙඩියක මිල) | 64.50 | 63.75 |

### 1.2.5 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| සම්බා | 216.50 | 210.50 | 215.80 | 122.50 |
| සුදු කැකුළු | 199.00 | 201.60 | 206.70 | 101.10 |
| රතු කැකුළු | 210.00 | 210.00 | 210.50 | 97.80 |
| නාඩු | 208.40 | 204.10 | 210.80 | 109.60 |

### 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | |
| **සහල්** | | |
| සම්බා | 225.00 | 225.00 |
| රතු කැකුළු | 210.00 | 210.00 |
| **එළවළු** | | |
| බෝංචි | 456.00 | 495.00 |
| ගෝවා | 492.00 | 485.00 |
| කැරට් | 400.00 | 445.00 |
| තක්කාලි | 280.00 | 245.00 |
| වට්ටක්කා | 224.00 | 245.00 |
| පතෝල | 384.00 | 405.00 |
| වම්බටු | 416.00 | 435.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු (ආනයනික) | 172.00 | 165.00 |
| අර්තාපල් (දේශීය) | 416.00 | 470.00 |
| අර්තාපල් (ආනයනික) | 240.00 | 292.50 |
| වියළි මිරිස් (ආනයනික) | 1,672.00 | 1,720.00 |
| පරිප්පු | 468.00 | 482.50 |
| සුදු සීනි | 271.00 | 281.25 |
| බිත්තර-සුදු (එකක මිල) | 47.00 | 47.25 |
| පොල් (ගෙඩියක මිල) | 96.00 | 91.25 |
| අමු මිරිස් | 460.00 | 430.00 |
| **මාළු** | | |
| කෙලවල්ලා | 2,052.00 | 2,440.00 |
| බලයා | 900.00 | 677.50 |
| සාලයා | 548.00 | 590.00 |
| හුරුල්ලා | 755.00 | 985.00 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | 2020 වාර්ෂික (අ) | 2021 වාර්ෂික (අ) | 2021 දෙවන කාර්තුව (අ) | 2022 දෙවන කාර්තුව (අ) |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික | (1.4) | 2.5 | 11.2 | (8.4) |
| කාර්මික | (5.3) | 5.6 | 21.6 | (10.0) |
| සේවා | (1.9) | 3.3 | 8.3 | (2.2) |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | (9.3) | (5.2) | 62.0 | (35.1) |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **(3.5)** | **3.3** | **16.3** | **(8.4)** |

(අ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2021 ජන-අගෝ(අ) | 2022 ජන-අගෝ(ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ. මිලියන) | 212.0 | 170.2 | (19.7) |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 56.3 | 48.5 | (13.8) |
| පොල් | (ගෙඩි මිලියන) | 2,035.2 | 2,284.6 | 12.3 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික





## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | ජූලි 2021 (ආ) | ජූලි 2022 (ඇ) | % වෙනස |
|---|---|---|---|
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **109.9** | **85.6** | **(22.0)** |
| ආහාර නිෂ්පාදන | 116.2 | 88.4 | (24.0) |
| ඇඟලුම් නිෂ්පාදන | 87.7 | 103.0 | 17.5 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 150.8 | 93.9 | (37.7) |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 98.7 | 1.5 | (98.5) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 107.0 | 98.7 | (7.8) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 84.0 | 92.3 | 9.9 |
| පාන වර්ග | 119.3 | 127.8 | 7.1 |

(අ) ප්‍රධාන උප අංශ 7


(ආ) සංශෝධිත (ඇ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අගෝ. 2022 | ජූලි 2022 | අගෝ. 2021 | ජූලි 2021 | අගෝ. 2022 | ජූලි 2022 | අගෝ. 2021 | ජූලි 2021 |
| දර්ශකය | 49.6 | 41.4 | 45.1 | 57.8 | 51.7 | 43.0 | 46.2 | 55.7 |









## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2021 ජූලි | 2022 ජූලි | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - නාමික | 114.6 | 133.1 | 16.1 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) - නාමික | 199.6 | 263.1 | 31.8 |
| කෘෂිකර්මාන්ත | 203.5 | 267.3 | 31.3 |
| කර්මාන්ත | 203.0 | 261.6 | 28.8 |
| සේවා | 194.6 | 262.7 | 35.0 |




### 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2022 දෙවන කාර්තුව(ආ) | 2022 පළමුවන කාර්තුව | 2021 වාර්ෂික |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 50.1 | 51.2 | 49.9 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.6 | 4.3 | 5.1 |
| **අයිතමය** | **2022 පළමුවන කාර්තුව(ආ)** | **2021 සිව්වන කාර්තුව** | **2021 වාර්ෂික** |
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ඇ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 25.0 | 26.1 | 27.3 |
| කර්මාන්ත | 27.9 | 27.0 | 26.0 |
| සේවා | 47.1 | 46.9 | 46.7 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


### 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2021 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2021 ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2021 ලං.ඛ.තී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) | 2022 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2022 ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2022 ලං.ඛ.තී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 54.85 | 51.65 | 57.65 | 84.96 | 82.55 | 84.09 |
| පෙබරවාරි | 61.82 | 58.63 | 64.07 | 94.17 | 91.74 | 76.41 |
| මාර්තු | 65.89 | 62.60 | - | 114.05 | 109.66 | - |
| අප්‍රේල් | 65.22 | 61.61 | 66.44 | 105.56 | 101.23 | - |
| මැයි | 68.24 | 65.13 | 68.47 | 111.91 | 109.64 | 109.94 |
| ජූනි | 73.11 | 71.01 | - | 117.29 | 113.89 | - |
| ජූලි | 74.41 | 72.79 | 68.92 | 105.39 | 100.47 | - |
| අගෝස්තු | 70.45 | 67.76 | 74.88 | 98.07 | 91.79 | 114.71 |
| සැප්තැම්බර් | 74.70 | 71.21 | - | 91.03 | 84.58 | |
| ඔක්තෝබර් | 83.35 | 80.66 | 73.51 | | | |
| නොවැම්බර් | 81.67 | 79.54 | - | | | |
| දෙසැම්බර් | 74.63 | 71.55 | 85.38 | | | |
| **දිනය** | **2021** | | | **2022** | | |
| සැප්තැම්බර් 24 | 77.33 | 73.41 | | - | - | |
| සැප්තැම්බර් 25 | - | - | | - | - | |
| සැප්තැම්බර් 26 | - | - | | 86.08 | 78.75 | |
| සැප්තැම්බර් 27 | 79.50 | 75.27 | | 84.61 | 77.20 | |
| සැප්තැම්බර් 28 | 79.65 | 75.64 | | 85.94 | 78.27 | |
| සැප්තැම්බර් 29 | 78.24 | 74.41 | | 89.42 | 82.21 | |
| සැප්තැම්බර් 30 | 78.53 | 74.78 | | 88.51 | 81.46 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.තී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං .ඛ.තී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.තී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2021 වසරේ මාර්තු, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි සහ ජූලි යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.





### 1.9 දෛනික විදුලිබල උත්පාදනය

| අයිතමය | 2022 සැප්. 26 | 2022 සැප්. 27 | 2022 සැප්. 28 | 2022 සැප්. 29 |
|---|---|---|---|---|
| **උපරිම ඉල්ලුම (මෙ. වො.)** | **1,900.40** | **1,956.00** | **1,872.50** | **1,915.20** |
| **මුළු උත්පාදනය (ගි. වො. පැ.)** | **40.80** | **41.17** | **41.58** | **41.39** |
| ජල | 19.89 | 21.41 | 18.88 | 17.76 |
| ගල් අඟුරු | 12.22 | 6.50 | 6.51 | 6.49 |
| තෙල් | 6.58 | 11.84 | 11.73 | 12.98 |
| සුළං | 1.60 | 1.13 | 4.02 | 3.69 |
| සූර්ය (තොග) | 0.26 | 0.17 | 0.31 | 0.33 |

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය



# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| අයිතමය | 2022 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 14.50 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 15.50 | 6.00 |
| බැංකු අනුපාතිකය | 18.50 | 18.50 | 9.00 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | - | - | 5.94 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික** | | | |
| දින 91 | 31.94 | 31.95 | 6.70 |
| දින 182 | 30.59 | 30.63 | 6.99 |
| දින 364 | 29.85 | 29.87 | 7.01 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 25.95 | 26.89 | 6.42 |
| | 2022 අගෝ. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.05-6.00 | 0.05-6.00 | 0.10-6.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 0.15-28.00 | 0.15-26.00 | 0.25-15.00 |
| | 2022 සැප්. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 11.63 | 10.49 | 4.75 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 15.41 | 13.90 | 5.64 |
| | 2022 අගෝ. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 21.29 | 19.11 | 5.19 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 21.62 | 19.42 | 5.35 |
| | 2022 අගෝ. | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 16.86 | 15.94 | 9.38 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 24.18 | 22.42 | 8.04 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2022 අගෝ. | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 12.00 | 5.00 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 2 මාස 9<br>2022 සැප්තැම්බර් 29 | වසර 5 මාස 3<br>2022 සැප්තැම්බර් 29 | වසර 9 මාස 9<br>2022 සැප්තැම්බර් 29 |
|---|---|---|---|
| පොලී අනුපාතිකය | 18.00 | 18.00 | 18.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 30.95 | 31.50 | 30.09 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2022 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|
| ලංකා බැංකුව | 26.93 | 25.67 |
| මහජන බැංකුව (අ) | 30.00 | 30.00 |
| හැටන් නැෂනල් බැංකුව | 31.65 | 31.67 |
| කොමර්ෂල් බැංකුව | 29.43 | 29.87 |
| සම්පත් බැංකුව | 27.38 | 31.08 |
| සෙලාන් බැංකුව | 26.40 | 27.82 |
| යූනියන් බැංකුව | 29.92 | 27.96 |
| පැන් ඒෂියා බැංකුව | 27.09 | 26.81 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 29.02 | 27.86 |
| ඩීඑෆ්සීසී බැංකුව | 28.63 | 28.25 |
| එන්ඩීබී බැංකුව | 28.89 | 28.27 |
| අමානා බැංකුව (අ) | 28.27 | 28.27 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2022 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|
| කාර්ගිල්ස් බැංකුව | 33.00 | 32.30 |
| එච්එස්බීසී බැංකුව | 24.99 | 27.99 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 25.44 | 19.95 |
| සිටි බැංකුව | 27.16 | 28.00 |
| ඩොයිෂ් බැංකුව | 16.89 | 19.43 |
| හබීබ් බැංකුව | 26.21 | 27.76 |
| ඉන්දියන් බැංකුව | 27.03 | 27.14 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 23.44 | 23.44 |
| එම්සීබී බැංකුව (අ) | 27.22 | 27.22 |
| ඉන්දීය රාජ්‍ය බැංකුව | 22.22 | 26.63 |
| පබ්ලික් බැංකුව | 26.95 | 25.76 |

(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත . එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත .


## 2.2 මුදල් සැපයුම


| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2022 අගෝස්තු [අ] | මසකට පෙර | වසරකට පෙර [ආ] | 2022 අගෝස්තු [අ] | මසකට පෙර | වසරකට පෙර [ආ] |
| සංචිත මුදල් | 1,386.2 | 1,436.4 | 1,089.3 | 27.3 | 35.0 | 23.8 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 1,534.1 | 1,564.9 | 1,355.2 | 13.2 | 18.8 | 28.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 10,285.9 | 10,253.6 | 9,412.4 | 9.3 | 10.6 | 19.8 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 11,986.9 | 11,955.3 | 10,513.6 | 14.0 | 16.0 | 21.0 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් [ඇ] | (2,035.1) | (2,123.8) | (701.0) | (190.3) | (203.7) | (3,481.4) |
| මුදල් අධිකාරීන් | (1,614.9) | (1,686.2) | (83.9) | (1,825.2) | (16,543.7) | (110.2) |
| වාණිජ බැංකු | (420.2) | (437.6) | (617.1) | 31.9 | 38.3 | 26.7 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (596.8) | (586.8) | (345.3) | (72.8) | (35.4) | 20.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 176.6 | 149.1 | (271.8) | 165.0 | 154.0 | 33.1 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් [ඇ] | 14,022.0 | 14,079.2 | 11,214.6 | 25.0 | 28.0 | 28.7 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 6,990.1 | 6,826.4 | 5,531.4 | 26.4 | 26.2 | 44.2 |
| මහ බැංකුව | 3,311.1 | 3,263.9 | 1,534.4 | 115.8 | 130.2 | 187.0 |
| වාණිජ බැංකු | 3,679.0 | 3,562.5 | 3,997.0 | (8.0) | (10.8) | 21.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,212.5 | 3,057.5 | 3,584.7 | (10.4) | (14.2) | 27.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 466.5 | 505.0 | 412.3 | 13.2 | 18.1 | (16.6) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,699.8 | 1,754.0 | 1,136.9 | 49.5 | 53.7 | 11.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,578.3 | 1,629.3 | 656.3 | 140.5 | 149.2 | 12.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 121.5 | 124.7 | 480.6 | (74.7) | (74.4) | 8.8 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,614.2 | 7,673.1 | 6,795.5 | 12.0 | 15.2 | 15.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,887.2 | 6,945.7 | 6,267.1 | 9.9 | 12.7 | 14.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 726.9 | 727.4 | 528.4 | 37.6 | 46.0 | 19.2 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (2,282.1) | (2,174.4) | (2,249.2) | (1.5) | 1.6 | (9.6) |


(අ) තාවකාලික

(ආ ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කරන ලද ඇතැම් දත්ත නිවැරදිව වර්ගීකරණය නොකිරීම හේතුවෙන් , 2021 මාර්තු සිට 2022 ජනවාරි මස දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විසින් රජය වෙත ලබා දුන් ණය පිළිබඳ දත්ත සංශෝධනය කරන ලදී .

(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අදාළව





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2022 සැප්තැම්බර් 22 | 2022 සැප්තැම්බර් 29 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,365,664.61 | 1,343,152.92 | (22,511.69) |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2022 සැප්තැම්බර් 26 | 2022 සැප්තැම්බර් 27 | 2022 සැප්තැම්බර් 28 | 2022 සැප්තැම්බර් 29 | 2022 සැප්තැම්බර් 30 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට ) | - | - | - | - | - |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | - | - | - | - | - |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට ) | 15.50 | 15.50 | 15.50 | 15.50 | 15.50 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 1,300 | 3,650 | 2,150 | 2,000 | 600 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2022 සැප්තැම්බර් 26 | 2022 සැප්තැම්බර් 27 | 2022 සැප්තැම්බර් 28 | 2022 සැප්තැම්බර් 29 | 2022 සැප්තැම්බර් 30 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 2,321,112.05 | 2,321,112.05 | 2,321,112.05 | 2,321,112.05 | 2,320,401.75 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 2,171,902.84 | 2,173,599.86 | 2,175,235.53 | 2,176,889.05 | 2,171,423.75 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2022 සැප්තැම්බර් 26 | 2022 සැප්තැම්බර් 27 | 2022 සැප්තැම්බර් 28 | 2022 සැප්තැම්බර් 29 | 2022 සැප්තැම්බර් 30 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 325.137 | 329.317 | 324.684 | 326.916 | 317.194 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 769.350 | 758.789 | 744.127 | 741.269 | 750.654 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | (444.213) | (429.472) | (419.443) | (414.353) | (433.460) |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | (579.213) | (564.472) | (554.443) | (549.353) | (568.460) |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | | 2021<br>දෙසැ. අවසානයට | 2022<br>ජූලි අවසානයට | 2022<br>අගෝස්තු අවසානයට (ආ) |
|---|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | | 1,927,195 | 1,965,745 | 1,963,705 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | | 15,861 | 14,724 | 14,407 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | | 1,911,334 | 1,951,021 | 1,949,298 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | | 133,285 | 132,721 | 135,949 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | | 38,719 | 37,948 | 38,408 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | | 94,565 | 94,773 | 97,541 |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික


## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු. බිලියන) | 2021<br>දෙසැ. අවසානයට | 2022<br>ජූලි අවසානයට | 2022<br>අගෝස්තු අවසානයට (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) (ඇ) | 5.8 | 0.7 | 1.7 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.1 | 0.2 | 1.2 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික (ඇ) වසරේ මේ දක්වා එකතුව




## 2.9 කොටස් වෙළඳපොළ


| අයිතමය | 2022 සැප්තැම්බර් 30 වැනි දිනට | 2022 සැප්තැම්බර් 23 වැනි දිනට | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය<br>(1985 = 100) (ASPI) | 9,931.07 | 9,964.80 | 9,442.30 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය<br>(2004 = 1,000) (S&P SL20) | 3,165.33 | 3,203.01 | 3,539.55 |
| දෛනික පිරිවැටුම (සතිපතා සාමාන්‍යය) (රු. මිලියන) | 3,917.12 | 4,227.08 | 6,323.86 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 4,341.13 | 4,369.91 | 4,207.68 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 209.39 | 70.32 | 29.26 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 139.88 | 53.49 | 22.45 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 69.51 | 16.83 | 6.81 |

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2021 ජූනි | 2022 ජූනි [(අ)] |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **715.3** | **919.5** |
| ආදායම | 714.5 | 918.5 |
| බදු ආදායම | 641.2 | 798.8 |
| බදු නොවන | 73.3 | 119.7 |
| ප්‍රදාන | 0.7 | 1.0 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **1,495.5** | **1,822.1** |
| පුනරාවර්තන | 1,311.0 | 1,571.6 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 184.5 | 250.5 |

(අ) තාවකාලික





## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන) [(අ)]

| ශීර්ෂය | 2021 වසර අවසානයට | 2022 අප්‍රේල් අවසානයට [(ආ)] |
|---|---|---|
| සමස්ත දේශීය ණය | 11,097.2 | 12,442.3 |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,270.5 | 2,846.7 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 6,966.2 | 7,883.7 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 6,492.2 | 10,867.8 |
| **මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය** | **17,589.4** | **23,310.1** |

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර , නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත .

(ආ) තාවකාලික




මූලයන් : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව


## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 සැප්තැම්බර් 28 දිනෙන් අවසන් වූ සතියට

| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ [(අ)] % | | ද්විතීයික වෙළඳපොළ [(ආ)] % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | පසුගිය සතියේ සාමාන්‍යය |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | |
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 31.94 | 31.95 | 30.41 | 29.10 | 29.75 | 29.35 |
| | දින 182 | 30.59 | 30.63 | 29.38 | 27.94 | 28.66 | 28.29 |
| | දින 364 | 29.85 | 29.87 | 29.16 | 27.93 | 28.54 | 28.44 |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 24.81 | 21.91 | 23.36 | 23.48 |
| | < වසර 03 | - | - | 26.48 | 25.20 | 25.84 | 25.92 |
| | < වසර 04 | - | - | 25.85 | 24.44 | 25.14 | 25.12 |
| | < වසර 05 | - | - | 26.48 | 23.96 | 25.22 | 25.26 |
| | < වසර 06 | - | - | 26.63 | 24.88 | 25.75 | 25.86 |
| | < වසර 08 | - | - | 26.80 | 24.85 | 25.82 | 25.87 |
| | < වසර 10 | - | - | 27.15 | 25.04 | 26.10 | 26.08 |
| | < වසර 15 | - | - | 24.70 | 21.33 | 23.01 | 23.01 |
| | < වසර 20 | - | - | 21.91 | 19.44 | 20.67 | 20.80 |
| | < වසර 30 | - | - | 20.17 | 18.23 | 19.20 | 19.45 |


(අ) 2022 සැප්තැම්බර් 28 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු

(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යන්‍ය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය ඉහළට විතැන් වී ඇති අතර භාණ්ඩාගාර බැඳුම්කර ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය පුළුල් ලෙස එම මට්ටම්වලම පවතී.**




| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය % | ද්විතීයික වෙළඳපොළ % | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2023-අප්‍රේ-18 | 5.75 | - | - |
| | 2024-මාර්-14 | 6.85 | - | - |
| | 2024-ජුනි-28 | 6.35 | - | - |
| | 2025-ජුනි-03 | 6.13 | - | - |
| | 2025-නොවැ-03 | 6.85 | - | - |
| | 2026-ජුලි-18 | 6.83 | - | 47.89 |
| | 2027-මැයි-11 | 6.20 | 46.05 | 42.81 |
| | 2028-අප්‍රේ-18 | 6.75 | 41.94 | 39.46 |
| | 2029-මාර්-14 | 7.85 | 38.45 | 35.98 |
| | 2030-මාර්-28 | 7.55 | 34.66 | 35.58 |



## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2022 සැප්තැම්බර් 28 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 3,630,079.88 | 3,615,574.64 |
| භාණ්ඩාගාර බැඳුම්කර (අ) | 8,451,191.08 | 8,451,191.08 |
| **එකතුව** | **12,081,270.96** | **12,066,765.72** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 22,173.40 | 15,769.26 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ආ) | 340,465.30 | 340,465.30 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 40.61කින් ඉහළ ගොස් ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 85,000.00 | 65,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 151,766.00 | 142,646.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 81,680.00 | 65,000.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | - | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | - | - |

**මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 1.8ක ගුණයකි.**

| ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 113,541.77 | 117,455.50 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 253,379.46 | 309,786.40 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 93,126.65 | 157,768.46 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 267,105.12 | 358,077.88 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 22.90ක ප්‍රතිශතයකින් අඩු වී ඇත.**

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද, 2032.01.01 දින පරිණත වීමට නියමිත රු. මිලියන 31,445.60 ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ.

(ආ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල පියවීමට ඇති ණය මුදල 2022 අගෝස්තු 31 දිනට ආයෝජක තහවුරු කිරීම් මත පදනම්ව අදාළ සුරැකුම් පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංකය නිකුත් කිරීම මත පදනම් වේ.

## 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) - 2022 සැප්තැම්බර් 30

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය ගැනුම් මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැනුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.58 | 22.03 | 99.62 | 19.59 | 0.05 |
| මාස 1 | 98.00 | 24.82 | 98.20 | 22.24 | 0.21 |
| මාස 2 | 95.89 | 25.97 | 96.20 | 23.96 | 0.31 |
| මාස 3 | 92.84 | 30.85 | 93.11 | 29.60 | 0.27 |
| මාස 4 | 91.32 | 28.81 | 92.00 | 26.39 | 0.67 |
| මාස 5 | 89.46 | 28.60 | 90.27 | 26.16 | 0.81 |
| මාස 6 | 87.12 | 29.56 | 87.70 | 28.06 | 0.57 |
| මාස 7 | 86.03 | 28.15 | 86.99 | 25.93 | 0.96 |
| මාස 8 | 84.35 | 28.14 | 85.39 | 25.96 | 1.04 |
| මාස 9 | 82.70 | 28.21 | 83.82 | 26.02 | 1.13 |
| මාස 10 | 81.14 | 28.21 | 82.40 | 25.91 | 1.27 |
| මාස 11 | 79.56 | 28.34 | 80.56 | 26.61 | 1.00 |
| මාස 12 | 77.42 | 29.17 | 78.34 | 27.66 | 0.92 |


## 3.6 ද්වී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2022 සැප්තැම්බර් 30

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය ගැනුම් මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැනුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 10.00%2022A | 8 | 2022 ඔක්තෝබර් 1 | 1 | 99.96 | 22.25 | 99.97 | 20.03 | 0.01 |
| 05.75%2022A | 3 | 2022 නොවැම්බර් 15 | 46 | 97.81 | 23.25 | 98.20 | 20.09 | 0.39 |
| 07.90%2022A | 3 | 2022 දෙසැම්බර් 15 | 76 | 96.85 | 23.27 | 97.42 | 20.36 | 0.57 |
| 08.65%2023A | 3 | 2023 ජනවාරි 15 | 107 | 95.88 | 23.37 | 96.62 | 20.58 | 0.75 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු 15 | 166 | 94.38 | 23.48 | 95.47 | 20.74 | 1.08 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 227 | 93.29 | 23.55 | 94.72 | 20.84 | 1.43 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 288 | 90.12 | 24.59 | 92.42 | 21.01 | 2.30 |
| 09.00%2023A | 10 | 2023 සැප්තැම්බර් 1 | 336 | 87.02 | 25.69 | 89.84 | 21.74 | 2.82 |
| 11.20%2023A | 9 | 2023 සැප්තැම්බර් 1 | 336 | 89.94 | 23.97 | 91.20 | 22.25 | 1.26 |
| 07.00%2023A | 20 | 2023 ඔක්තෝබර් 1 | 366 | 84.31 | 25.73 | 87.32 | 21.75 | 3.00 |
| 06.30%2023A | 3 | 2023 නොවැම්බර් 15 | 411 | 83.05 | 24.39 | 85.64 | 21.28 | 2.59 |
| 11.60%2023A | 5 | 2023 දෙසැම්බර් 15 | 441 | 86.74 | 24.89 | 89.04 | 22.38 | 2.29 |
| 11.40%2024A | 10 | 2024 ජනවාරි 1 | 458 | 86.51 | 24.46 | 88.37 | 22.49 | 1.86 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු 15 | 532 | 83.52 | 25.06 | 87.25 | 21.53 | 3.74 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 624 | 80.68 | 24.74 | 84.44 | 21.58 | 3.76 |
| 11.00%2024A | 8 | 2024 අගෝස්තු 1 | 671 | 79.22 | 25.86 | 82.60 | 23.11 | 3.38 |
| 09.85%2024A | 5 | 2024 සැප්තැම්බර් 15 | 716 | 77.54 | 25.03 | 82.04 | 21.56 | 4.50 |
| 06.00%2024A | 10 | 2024 දෙසැම්බර් 1 | 793 | 69.45 | 25.08 | 73.99 | 21.63 | 4.55 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු 15 | 897 | 71.46 | 26.83 | 72.99 | 25.73 | 1.53 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 944 | 68.53 | 26.56 | 69.57 | 25.83 | 1.04 |
| 17.00%2025A | 3 | 2025 ජූනි 1 | 975 | 80.44 | 27.79 | 82.31 | 26.61 | 1.87 |
| 18.00%2025A | 3 | 2025 ජූලි 1 | 1,005 | 80.42 | 28.68 | 81.41 | 28.06 | 0.99 |
| 11.00%2025A | 10 | 2025 අගෝස්තු 1 | 1,036 | 69.03 | 27.35 | 70.60 | 26.31 | 1.57 |
| 10.35%2025A | 8 | 2025 ඔක්තෝබර් 15 | 1,111 | 68.63 | 25.86 | 69.88 | 25.08 | 1.25 |
| 06.75%2026A | 5 | 2026 ජනවාරි 15 | 1,203 | 58.98 | 26.03 | 62.47 | 23.81 | 3.49 |
| 09.00%2026A | 13 | 2026 පෙබරවාරි 1 | 1,220 | 63.59 | 25.93 | 68.11 | 23.23 | 4.51 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු 1 | 1,248 | 55.55 | 25.62 | 57.28 | 24.50 | 1.73 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 1,340 | 66.19 | 25.75 | 68.28 | 24.58 | 2.08 |
| 11.50%2026A | 10 | 2026 අගෝස්තු 1 | 1,401 | 65.75 | 26.13 | 68.02 | 24.88 | 2.26 |
| 11.40%2027A | 8 | 2027 ජනවාරි 15 | 1,568 | 63.62 | 25.90 | 67.67 | 23.80 | 4.05 |
| 18.00%2027A | 5 | 2027 මැයි 1 | 1,674 | 78.39 | 26.36 | 84.13 | 23.85 | 5.74 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 1,719 | 62.70 | 25.87 | 68.05 | 23.24 | 5.34 |
| 07.80%2027A | 7 | 2027 අගෝස්තු 15 | 1,780 | 50.21 | 26.59 | 56.49 | 23.13 | 6.28 |
| 10.30%2027A | 8 | 2027 ඔක්තෝබර් 15 | 1,841 | 56.79 | 26.22 | 61.00 | 24.05 | 4.21 |
| 11.25%2027A | 10 | 2027 දෙසැම්බර් 15 | 1,902 | 56.96 | 27.12 | 60.46 | 25.30 | 3.49 |
| 18.00%2028A | 6 | 2028 ජනවාරි 15 | 1,933 | 72.54 | 28.25 | 77.48 | 26.03 | 4.94 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු 15 | 1,993 | 55.14 | 26.87 | 57.87 | 25.43 | 2.73 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 2,040 | 49.68 | 26.89 | 52.24 | 25.47 | 2.57 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 2,101 | 48.42 | 27.21 | 53.17 | 24.62 | 4.74 |
| 11.50%2028A | 13 | 2028 සැප්තැම්බර් 1 | 2,163 | 55.55 | 26.90 | 58.53 | 25.39 | 2.98 |
| 13.00%2029A | 15 | 2029 ජනවාරි 1 | 2,285 | 58.11 | 27.29 | 61.74 | 25.53 | 3.64 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 2,405 | 57.38 | 27.24 | 60.83 | 25.58 | 3.45 |
| 20.00%2029A | 7 | 2029 ජූලි 15 | 2,480 | 78.80 | 26.91 | 84.15 | 24.91 | 5.36 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 2,784 | 49.92 | 26.66 | 54.32 | 24.49 | 4.40 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු 15 | 3,088 | 48.65 | 26.91 | 52.37 | 25.05 | 3.72 |
| 18.00%2031A | 9 | 2031 මැයි 15 | 3,149 | 67.07 | 28.36 | 71.21 | 26.64 | 4.14 |
| 12.00%2031A | 10 | 2031 දෙසැම්බර් 1 | 3,349 | 50.28 | 26.76 | 54.23 | 24.86 | 3.95 |
| 08.00%2032A | 20 | 2032 ජනවාරි 1 | 3,380 | 36.69 | 26.77 | 43.02 | 23.20 | 6.34 |
| 18.00%2032A | 10 | 2032 ජූලි 1 | 3,562 | 63.59 | 29.47 | 65.60 | 28.57 | 2.01 |
| 09.00%2032A | 20 | 2032 ඔක්තෝබර් 1 | 3,654 | 40.15 | 26.08 | 44.25 | 23.86 | 4.10 |
| 11.20%2033A | 15 | 2033 ජනවාරි 15 | 3,760 | 47.50 | 26.05 | 52.95 | 23.48 | 5.45 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 3,897 | 41.26 | 24.93 | 47.80 | 21.75 | 6.54 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 3,927 | 56.98 | 24.85 | 65.44 | 21.63 | 8.46 |
| 09.00%2033B | 20 | 2033 නොවැම්බර් 1 | 4,050 | 41.11 | 24.75 | 47.87 | 21.50 | 6.76 |
| 13.25%2034A | 20 | 2034 ජනවාරි 1 | 4,111 | 55.54 | 25.30 | 66.45 | 21.15 | 10.92 |
| 10.25%2034A | 15 | 2034 සැප්තැම්බර් 15 | 4,368 | 45.98 | 24.25 | 53.49 | 21.00 | 7.51 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු 15 | 4,549 | 50.71 | 24.13 | 58.64 | 20.95 | 7.93 |
| 10.50%2039A | 20 | 2039 අගෝස්තු 15 | 6,163 | 45.42 | 23.75 | 51.99 | 20.88 | 6.57 |
| 12.00%2041A | 25 | 2041 ජනවාරි 1 | 6,668 | 60.95 | 20.07 | 68.04 | 18.00 | 7.08 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 7,549 | 45.78 | 20.10 | 51.08 | 18.10 | 5.30 |
| 13.50%2044A | 30 | 2044 ජනවාරි 1 | 7,763 | 67.53 | 20.13 | 74.74 | 18.20 | 7.21 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 7,915 | 67.27 | 20.20 | 74.43 | 18.27 | 7.16 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු 1 | 8,188 | 62.19 | 20.25 | 68.77 | 18.33 | 6.57 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික (අ)

| අයිතමය | 2022 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)(ආ) | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 359.16 | 369.91 | 364.54 | 364.56 | 200.75 |
| ස්ටර්ලිං පවුම් | 396.35 | 412.46 | 404.40 | 409.49 | 269.76 |
| ජපන් යෙන් | 2.47 | 2.57 | 2.52 | 2.57 | 1.80 |
| යූරෝ | 349.92 | 364.63 | 357.28 | 358.14 | 233.68 |
| ඉන්දියානු රුපියල් (ඇ) | | | 4.45 | 4.48 | 2.69 |
| විශේෂ ගැනුම් හිමිකම් | ( 2022 සැප්තැම්බර් 29 දිනට ) | | 463.02 | 467.46 | 282.69 |
| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් (ඈ) (එ.ජ. ඩොලර් මිලියන ) | | | 2022 අගෝස්තු | මසකට පෙර | වසරකට පෙර |
| මිලදී ගැනීම් | | | 215.61 | 117.65 | 49.38 |
| විකිණීම් | | | 200.59 | 276.58 | 225.50 |




| අයිතමය | | 2022 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | | 18.22 | 20.72 | 29.01 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) (ඉ) | | | | |
| මාස 1 | | 365.53 | 364.77 | 201.80 |
| මාස 3 | | 362.90 | - | 202.10 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | | 15.87 | 17.97 | 15.10 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | ( 2022 සැප්තැම්බර් 29 දිනට ) | 256.14 | 251.68 | 670.49 |

(අ) මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13වැනි දින සිට අන්තර් බැංකු බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකය සහ විචලන සීමාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය.

(ආ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව. 9.30 ට පවතින)

(ඇ) මහ බැංකුවේ දෛනික මධ්‍යය විනිමය අනුපාතිකය

(ඈ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්


(ඉ) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය


## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

| අයිතමය | | 2021 අගෝස්තු | 2022(අ) අගෝස්තු | 2021 ජන.-අගෝ. | 2022(අ) ජන.-අගෝ. | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | 5,040 | 37,760 | 24,377 | 496,430 | 1,936.5 |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 13.1 (ආ) | 67.9 | 63.5 (ආ) | 892.8 | 1,305.3 |
| | (රුපියල් බිලියන) | 2.6 (ආ) | 24.5 | 12.6 (ආ) | 246.0 | 1,859.8 |
| | | 2021 අගෝස්තු | 2022(අ) අගෝස්තු | 2021 ජන.-අගෝ. | 2022(අ) ජන.-අගෝ. | % වෙනස |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ | (එ.ජ. ඩොලර් මිලියන) | 446.6 | 325.4 | 4,224.3 | 2,214.8 | (47.6) |
| ප්‍රේෂණ ලැබීම් | (රුපියල් බිලියන) | 89.5 | 117.5 | 831.7 | 680.8 | (18.1) |

(අ) තාවකාලික

(ආ) 2021 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත.



## 4.3 2022 අගෝස්තු මස අවසානයට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය [අ]

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|
| නිල සංචිත වත්කම් [ආ] | **1,717** |
| (1) විදේශ මුදල් සංචිත | 1,620 |
| (අ) සුරැකුම්පත් | 30 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 1,589 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල සමඟ | 1,573 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 1 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 15 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 62 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 8 |
| (4) රත්‍රන් | 26 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් [ඇ] (එ.ජ. ඩොලර් මිලියන)


| අයිතමය | | එකතුව | කල්පිරීම | | |
|---|---|---|---|---|---|
| | | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු [ඈ] | | (3,106) | (85) | (231) | (2,790) |
| ගෙවීම් (–) | ණය වාරික ආපසු ගෙවීම | (2,738) | (51) | (164) | (2,522) |
| | පොලිය | (368) | (34) | (66) | (268) |
| ලැබීම් (+) | ණය වාරික ආපසු ලැබීම | | | | |
| | පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | | (1,831) | (258) | 85 | (1,658) |
| (i) හිඟ (–)[ඉ] | | (2,183) | (525) | - | (1,658) |
| (ii) අතිරික්ත (+) | | 353 | 268 | 85 | - |
| 3. අනෙකුත් | | (3.1) | (3.1) | | |
| ප්‍රතිවිකිණුම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ගෙවීම් (-) | | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | | (3.1) | (3.1) | | |


(අ) තාවකාලික
(ආ) එ.ජ. ඩොලර් බිලියන 1.4කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර , එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ .
(ඇ) මෙහි ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම් ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ .
(ඈ) තෝරාගත් විදේශීය ණය සේවාකරණයන් තාවකාලිකව අත්හිටුවන බවට රජය විසින් නිවේදනය කිරීමෙන් පසුව , පුරෝකථනය කරන ලද කෙටි කාලීන ශුද්ධ ගෙවීම් ඇතුළත් වේ .
(ඉ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .


## 4.4 විදේශීය වෙළඳාම


| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2021 ජන.- ජූලි | 2022 ජන.- ජූලි (අ) | % වෙනස | 2021 ජන.- ජූලි | 2022 ජන.- ජූලි (අ) | % වෙනස |
| **අපනයන** | **6,803.0** | **7,677.8** | **12.9** | **1,340,057.3** | **2,267,488.7** | **69.2** |
| කෘෂිකාර්මික | 1,526.0 | 1,454.3 | (4.7) | 300,742.8 | 431,228.3 | 43.4 |
| කාර්මික | 5,236.9 | 6,192.5 | 18.2 | 1,031,399.4 | 1,827,487.3 | 77.2 |
| ආහාර, පාන හා දුම්කොළ | 296.5 | 324.1 | 9.3 | 58,407.0 | 95,567.5 | 63.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,941.5 | 3,528.7 | 20.0 | 579,058.5 | 1,043,504.7 | 80.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 248.6 | 377.6 | 51.9 | 49,061.7 | 108,104.6 | 120.3 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 621.0 | 625.2 | 0.7 | 122,376.6 | 184,244.2 | 50.6 |
| වෙනත් | 1,129.2 | 1,337.0 | 18.4 | 222,495.6 | 396,066.3 | 78.0 |
| ඛනිජ අපනයන | 27.6 | 18.6 | (32.4) | 5,433.5 | 5,089.3 | (6.3) |
| වෙනත් අපනයන | 12.5 | 12.4 | (1.2) | 2,481.6 | 3,683.9 | 48.5 |
| **ආනයන** | **11,724.8** | **11,315.0** | **(3.5)** | **2,309,571.9** | **3,207,800.3** | **38.9** |
| පාරිභෝගික භාණ්ඩ | 2,255.0 | 1,714.4 | (24.0) | 444,050.0 | 473,907.2 | 6.7 |
| අන්තර් භාණ්ඩ | 6,932.4 | 7,547.5 | 8.9 | 1,365,375.3 | 2,160,446.5 | 58.2 |
| ආයෝජන භාණ්ඩ | 2,530.6 | 2,050.9 | (19.0) | 498,804.3 | 572,881.0 | 14.9 |
| වෙනත් | 6.8 | 2.2 | (67.9) | 1,342.3 | 565.7 | (57.9) |
| **වෙළඳ ශේෂය** | **(4,921.8)** | **(3,637.2)** | | **(969,514.7)** | **(940,311.6)** | |


(අ) තාවකාලික





## 4.5 වෙළඳ දර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2022 ජූලි (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 162.0 | 173.7 | 153.6 |
| ප්‍රමාණය | 149.9 | 193.9 | 163.0 |
| ඒකක වටිනාකම | 108.0 | 89.6 | 94.3 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 115.2 | 109.8 | 153.0 |
| ප්‍රමාණය | 97.3 | 102.2 | 152.7 |
| ඒකක වටිනාකම | 118.4 | 107.4 | 100.2 |
| වෙළෙඳ මිල අනුපාතය | 91.2 | 83.4 | 94.0 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.6 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2021 ජූලි | 2022 ජූලි (අ) | % වෙනස | 2021 ජූලි | 2022 ජූලි (අ) | % වෙනස |
|---|---|---|---|---|---|---|
| කොළඹ තේ වෙන්දේසිය | කි.ග්‍රෑම් 1 ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1 ක් රුපියල් | | |
| තේ මිල | 2.96 | 4.08 | 37.9 | 591.09 | 1,471.44 | 148.9 |
| ආනයන (මි.ර.ගැ.) | මෙට්‍රික් ටොන් 1 ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1 ක් රුපියල් | | |
| සහල් | 849.01 | 306.75 | (63.9) | 169,782.43 | 110,699.26 | (34.8) |
| සීනි | 623.64 | 551.46 | -11.6 | 124,713.91 | 199,005.17 | 59.6 |
| තිරිඟු | 294.30 | 387.58 | 31.7 | 58,854.26 | 139,866.83 | 137.6 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් (ආ) | 68.92 | - | - | 13,782.71 | - | - |

(අ) තාවකාලික

(ආ) 2022 වසරේ ජූලි මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.